**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධිපාඨමාලාව - තුන්වන මට්ටම**
**අවසාන පරීක්ෂණය (විවෘත ග්‍රන්ථ - මාර්ගගත) – 2020/2021**
**LLU3901 /LWU1201- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I**
**කාලය පැය තුනයි (03)**

---

**දිනය: 2021 සැප්තැම්බර් 13** **වේලාව: පස්වරු1.00 – පස්වරු 4.00**

---

**මුලු ප්‍රශ්ණ ගණන 6 යි. ප්‍රශ්ණ හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න.**

**අපහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**1.** අධ්‍යාපනය පෞද්ගලීකරණය සහ මිලිටරීකරණයට එරෙහිව ඩයමන්ඩ් රාජ්‍යයේ අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය විසින් අඛණ්ඩ උද්ඝෝෂණ මාලාවක් සංවිධානය කරන ලදී. ඩයමන්ඩ් රාජ්‍යයේ අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයකු වන දේශප්‍රිය, ඩයමන්ඩ් රාජ්‍යයේ අගනුවර පිහිටා ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරිපිට පැවති එවැනි එක් විරෝධතාවයකට සහභාගී විය.සියලුම වෘත්තීය සමිති සාමාජිකයින් සිය අප්‍රසාදය ප්‍රකාශ කරනු පිණිස පුවරු, පෝස්ටර් සහ බැනර් ඔසවාගෙන සිටියහ. විරෝධතාවය එසේ පැවැත්වෙන අතරතුරදී ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අධීක්ෂණය යටතේ එතැනට පැමිණි පොලිස් නිළධාරීන් කණ්ඩායම විසින් විරෝධතාකරුවන්ට බාධා කරමින් පවසා සිටියේ විරෝධතාවය නැවැත්වීමට පොලිසිය විසින් උසාවි නියෝගයක් ලබා ගෙන ඇති බවයි. තවද ඩයමන්ඩ් රාජ්‍යයේ දැනට පවතින වසංගත තත්වය හේතුකොට ගෙන විරෝධතාවයට සහභාගී වූ සියලුම දෙනාට කඩිනම් ප්‍රතිදේහජනක පරීක්ෂණයකට භාජනය වන ලෙස දක්වා සිටියේය. තවද ඔවුන් විරෝධතාකරුවන්ගෙන් ඉල්ලා සිටියේ පෙළපාලිය වහාම නතනරකල යුතු බවත්, ප්‍රතිදේහ ජනක පරීක්ෂණ සිදුකිරීම සඳහා එකිනෙකා සම්බන්ධ විය යුතු බවත් ය. පොලිසියේ ක්‍රියාවන්ගෙන් කෝපයට පත් විරෝධතාකරුවන් මාර්ග බාධක සියල්ල බිඳ දමමින් ඉදිරියට ගියහ. දේශප්‍රිය ඔහුගේ සගයන් කිහිප දෙනෙකු සමග ඒ ආසන්නයේ පිහිටි අධි ආරක්ෂිත කළාපයකට පිවිසි අතර ඔවුන් ඩයමන්ඩ් රාජ්‍යයේ,වර්තමාන රජය විවේචනය කරමින් එහි තාප්ප වල කාටූන් ඇඳීමට පටන් ගත්හ.චිත්‍ර අඳිමින් සිටියදී, තම උසස් නිලධාරියෙකුගේ අණ පරදි හමුදාව විසින් විරෝධතාකරුවන්ට වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලදී. එම වෙඩි පහරින්, දේශප්‍රිය එම ස්ථානයේදීම මිය ගිය අතර තවත් සිසුන් දෙදෙනෙකු බරපතල ලෙස තුවාල ලැබීය. පසුව, දේශප්‍රියගේ මව්පියන්ට දැනගන්නට ලැබුනේ ජනාධිපතිවරයා රැගෙන යන රථ පෙළපාලියේ එම හමුදා නිළධාරියා සිටි බවත් ඔහු ඩයමන්ඩ් රාජ්‍යයේ ජනාධිපතිවරයාගේ මිතුරකු බවත් ය.

**I.** මෙම වෙඩි තැබීම සිදුකල හමුදා නිළධාරියාට ඩයමන්ඩ් රාජ්‍යයේ ජනාධිපති විසින් ජනාධිපති සමාව ලබා දුන් අතර, ඔහු අත්අඩංගුවට ගැනීම වැළැක්වීම සහ කිසිදු හෝ නීතිමය ක්‍රියාදාමයකින් ඔහුට මුක්තිය ලබා දෙන ලදී.

**II.** ජනාධිපති සමාව දීමට ගත් තීරණය අභියෝගයට ලක් කරමින් දේශප්‍රියගේ පියා විසින් ඩයමන්ඩ් රාජ්‍යයේහි ජනාධිපතිවරයාට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සමක් ගොනු කරන ලදී.

ඩයමන්ඩ් රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන යැයි උපකල්පනය කරන්න.

ඉහත සන්දර්භය තුළ සඳහන් එක් එක් පාර්ශවයන්ගේ ක්‍රියාවන්ට ඔබ එකග වන්නේද**?**

සාකච්ඡා කරන්න.

ඔබගේ පිළිතුර සුදුසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇසුරෙන් තහවුරු කල යුතු වේ.

**(ලකුණු 25)**

**2.** පහත සිද්ධීන් කියවා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ආධිපත්‍ය යන සංකල්පය ඇසුරෙන් එක් එක් පාර්ශවයන්ගේ ක්‍රියාවන්ගේ වලංගුභාවය පරීක්ෂා කරන්න. ශ්‍රී ලංකාවේ දෙවන ජනරජ ව්‍යවස්ථාව පර්ල් රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට සමාන යැයි උපකල්පනය කරන්න.

**I.** පර්ල් රාජ්‍යයේ රජය විසින් එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **3** වන පරිච්ඡේදයේ**,10** වන වගන්තියට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **6** වන වගන්තියට කොටසක් එකතු කිරීම සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යස්ථා සංශෝධනයකට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබේ.ඒ අනුව පිළිවෙලින්**, 3** වන පරිච්ඡේදයේ **10** වන වගන්තිය මූලික අයිතිවාසිකමක් ලෙස සිතීමේ හෘද සාක්ෂියේ නිදහස ඇතුලුව ආගමික නිදහස පිළිබදව දක්වන අතර**,** එහි **6** වන වගන්තිය ජාතික කොඩිය පිළිබදව ප්‍රකාශ කරයි.මෙම පනත් කෙටුම්පත සිවිල් සංවිධාන විසින් අභියෝගයට ලක් කරනු ලබයි.

**II.** පර්ල් රාජ්‍යයේ සංචාරක සංවර්ධන පනතේ සංශෝධිත **12** වන වගන්තිය මඟින් පිරිමි සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුබසාධනය සඳහා සහනදායී සෞඛ්‍ය යෝජනා ක්‍රමයක් සේවයෙන් විශ්‍රාම යාමේදී සහ ඉන් පසුව ලබා දේ.තවද**,** මෙම වගන්තිය මඟින් මෙම විශේෂ සෞඛ්‍ය යෝජනා ක්‍රමයේ වරප්‍රසාද කාන්තා සේවකයින්ට ද ලබා දී ඇති නමුත් එය විශ්‍රාම යාමෙන් අවසන් කරන බව ප්‍රකාශ කරයි.පර්ල් රාජ්‍ය විසින් සේවකයින්ගේ සමාන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යයන්තර සම්මුතියට අත්සන් තබා අනුමත කර ඇත **(**ICERE).

ICERE හි **9** වන වගන්තියේ සඳහන් වන්නේ පිරිමින් සහ ගැහැණුන් සඳහා සමාන වැටුප් ලැබීමේ අයිතිය පිළිබඳව ය.

**(ලකුණු 25)**

**3.** ආචාර්ය එල්.ජේ.එම් කූරේ ට අනුව, බලතල බෙදීමට විවිධ කරුණු තුනක් ඇතුළත් වේ:

- **I.** එකම පුද්ගලයින් රජයේ ආයතන තුනෙන් එකකට වඩා වැඩි කොටසක් නොවිය යුතුය.
- **II.** රජයේ එක් ආයතනයක් තවත් ආයතනයක් පාලනය කිරීම හෝ ආයතනයක් කෙරේ මැදිහත් වීමක් නොකළ යුතුය.
- **III.** රජයේ එක් ආයතනයක් තවත් ආයතනයක කාර්යයන් ඉටු නොකළ යුතුය.

***Reflections on the Constitution and the Constituent Assembly, (1971), p. 107***

ඔබ සිතන පරිදි **1978** ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නිර්මාතෘවරුන් ඉහත සාධක තුනේ වැදගත්කම නොසලකා හැර ඇත්ද**?** ප්‍රායෝගික උදාහරණ**,** මෑත කාලීන නඩු නීතිය සහ ව්‍යවස්ථාමය නිදර්ශන සමඟ සාකච්ඡා කරන්න.

**(**ලකුණු **25)**

**4.** **'**ස්වාධීනත්වයට ඇති ලොකුම අන්තරාය පැමිණෙන්නේ රජයේ ආයතන හෝ දේශපාලන පක්ෂ හෝ ඇඟිලි ගැසීමෙනි. මහජන විශ්වාසය දිනා ගැනීම සඳහා, **'**නීතියේ ආධිපත්‍යය' පෝෂණය කිරීම හා තහවුරු කිරීමේ මූලික කරුණ වන්නේ අධිකරණය ස්වාධීන වීම පමණක් නොව ස්වාධීන යැයි පෙනීමයි**.** **'**

ජාතික නීති සමුළුව ඇමතීම සඳහා ඔබට ආරාධනා කර ඇතැයි සිතන්න. **'**නීතියේ ආධිපත්‍යය**,** ස්වාධීන අධිකරණයක් මඟින් තහවුරු කරනු ලැබේ**'** යන මාතෘකාව මත ඔබගේ දේශණය සකස් කරන්න.

එම දේශණයෙන් අධිකරණ ස්වාධීනත්වය සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ඔබේ න්‍යායික හා ප්‍රායෝගික දැනුම විදහා දැක්විය යුතුය.

**(**ලකුණු **25)**

**5.** ගිනි ගැනීමකට ලක් වූ රසායනික ද්‍රව්‍ය පටවාගත් භාණ්ඩ ප්‍රවාහන නැවක් එරට මුහුදු තීරයේ සෙමින් ගිලී යමින් පැවතීම නිසා ඉන්දියානා නම් රාජ්‍යයේ දරුණු පාරසරික හානියක් ඇති වී තිබේ. මුහුදුබත් වන නැවේ සුන්බුන් රසායනික ද්‍රව්‍ය ඇතුළු වෙරළට සේදීම හේතුවෙන් වෙරළ තීරයේ සිට කි.මී **100** ක් පමණ මසුන් මැරීම තහනම් කිරීමට ඉන්දියානා රජය තීරණය කළේය. ගැඹුරු ජලයේ මසුන් ඇල්ලීම සඳහා තවදුරටත් අවසර දී ඇති අතර පාරිභෝගිකයින් රසායනික දූෂණයට බිය වන බැවින් මුහුදු ආහාර අලෙවිය පහත වැටී ඇත. මෙම සිදුවීම හේතුවෙන් ධීවර කර්මාන්තය මත යැපෙන බොහෝ මිනිසුන්ගේ ජීවනෝපාය අහිමි වී තිබේ. මසුන් ඇල්ලීම සඳහා අවසර ලබා දී ඇති මුහුදු කලාපයේ මසුන් නොමැතිකම හේතුවෙන් මෙම ප්‍රජාවන් අතර නොසන්සුන්තාවයන් වර්ධනය වී ඇත. මෙම තත්වය නිසා ජීවනෝපාය අහිමි වූවන්ට මුදල් ආධාර ලබා දීමට රජය තවමත් කිසිදු පියවරක් ගෙන නොමැත.

ඉන්දියානාහි 'එක්සත් ධීවර සමිතියේ' සභාපති සොයිසා මහතා**,** මෙම පාරිසරික හානිය දිගුකාලීනව පැවතීම නිසා මත්ස්‍යයන්ට ඇති විය හැකි හානි**,** එම මත්ස්‍යයන් ආහාරයට ගැනීමෙන් ඇති විය හැකි අනතුරු**,** සෞඛ්‍ය බලපෑම් සහ ධීවරයන්ගේ ජීවනෝපාය අහිමි වීම ගැන සාකච්ඡා කිරීම සඳහා රැස්වීමක් කැඳවන ලදි. රැස්වීමෙන් පසු මෙම තීරණාත්මක අවස්ථාවේදී තමන්ට මූල්‍ය ආධාර ලබා දෙන ලෙස රජයට බල කිරීම සඳහා පෝස්ටර් සහ බැනර් ප්‍රදර්ශනය කරමින් නිහඬ විරෝධතාවයක

නිරත වීමට ඔවුන් තීරණය කළහ. විරෝධතාවයට පෙර දිනයේ , ඔහුගේ නිර්දෝෂීභාවය පිළිබඳ කරුණු නොසලකා, පොලිසිය සොයිසා මහතා අත්අඩංගුවට ගෙන දරුණු ලෙස පහර දී ඔහුව පොලිසියට ගෙන ගෙන යන ලදි.

පසුව ඔහු මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් නොකර පොලීසියේ රඳවා තබා ගන්නා ලදී. තවද, ඔහුට කම්බි පොල්ලකින් පහර දී දින හතරකට වැඩි කාලයක් අඳුරු කාමරයක තබා ඇති අතර ජලය හෝ ආහාර ද සපයා නැත දිගින් දිගටම සිදු වූ පහරදීම් අතරතුර සිහිසුන්ව ඇද වැටීම නිසා ඔහුව රෝහල් ගත කිරීමට සිදු විය . රෝහල්ගත කිරීමෙන් මාස දෙකකට පමණ පසුව, පොලීසියේදී මුහුණදීමට වූ මෙම අනපේක්ශිත අවාසනාවන්ත සිදුවීම නිසා සොයිසා මහතා ශාරීරික ගැටලු මෙන්ම මානසික ගැටලු වලින් පීඩා විඳින බව සොයිසා මහතාගේ බිරිඳට නිරීක්ශණය විය. දැන් ඔහුට තවදුරටත් තම ජීවනෝපාය කරගෙන යාමට හැකියාවක් නැති අතර ඔහුගේ පවුල විශාල කරදරයකට මුහුණ දී සිටී.

සොයිසා මහතාගේ බිරිඳ මේ පිලිබඳව උසාවියේ නඩුවක් ගොනු කිරීමට අදහස් කරයි . ඔබ සමාජ සුභසාධන සංවිධානයකට සම්බන්ධ නීතිඥවරයෙක් බවත් ඉන්දියානා හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව **1978** ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සමාන බවත් උපකල්පනය කරමින් සොයිසා මහත්මියට උපදෙස් ලබා දෙන්න.

ගැටලුවට අදාලව වන තත්කාලීන ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය වර්ධනයන් ඔබේ උපදෙස් සඳහා අදාල කරගත යුතුය**.**

**(ලකුණු 25)**

**6.** **'**සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දුන් වෙස්ට්මිනිස්ටර් මාදිලිය ශ්‍රී ලංකාවේ පශ්චාත් යටත්විජිත ව්‍යවස්ථාමය සංවර්ධනයන්ට පහසුකම් සැපයූ ප්‍රධාන මූලාශ්‍රය ලෙස පිළිගත හැකිය.

මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟද**? 1972** සහ **1978** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ධනයන් අදාල කරගනිමින් ඔබේ පිළිතුර විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකාවේ වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දෙන්න. ඔබේ පිළිතුරට ප්‍රායෝගික තත්වයන් ඇසුරෙන් දැක්විය යුතුය

**(ලකුණු 25)**

******සියලුම හිමිකම් ඇවිරිණි ******